**දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය**

**තනතුරු ඇබෑර්තු**

සි/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති තනතුර සඳහා සුදුසුකම්ලත් අයගෙන බඳවා ගැනීමට 2024.12.16 දින සිට 2025.01.04 දින දක්වා සමිති බල ප්‍රදේශය තුල වසර දෙකක ස්ථිර පදිංචිය සහිත බාහිර අයදුම්කරුවන් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. සමුපකාර සේවක කාර්යය විධිවිධාන 1.2.2 වගන්තියට අනුව සමිතියේ අභ්‍යන්තර සේවකයන් හට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

| තනතුර | වැ.ප අංකය හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| විදුලි කාර්මික | 104 - 08 III ශ්‍රේණිය | 01 | 22774 - 675x10-800x10-950x10-47024/= |
| වතු භාරකරු | 103 - 07 III ශ්‍රේණිය | 01 | 25104-800x10-950x10-1050x10-53104/= |
| මුරකරු | 105 – 10 III ශ්‍රේණිය | 01 | 19984 - 500x10-575x10-675x10-800 x5- 41484/= |
| මුදල් අයකැමි | 104 – 9 III ශ්‍රේණිය | 01 | 21284 - 575x10-675x10-800x10-41,784/= |

02. මෙම තනතුර ස්ථිරය.සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.

03. බඳවාගැනීමේ සුදුසුකම්

<u>විදුලි කාර්මික</u>

(අ) අ.පො.ස (සා.පෙ) විෂයන් හයකින් සමත් වී තිබීම සමග පිළිගත් ආයතනයක අදාල තනතුරේ වසර දෙකකට නොඅඩු සේවා පළපුරුද්ද ලබා තිබීම.

<u>වතු භාරකරු</u>

01.(අ) සීමාසහිත වතු සම්බන්ධ සමුපකාර සමිතියක 104.8 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර 05ක සතුටුදායක සේවා පලපුරුද්දක් ලබා තිබීම හෝ 104.9 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර 08ක සතුටුදායක සේවා පලපරුද්දක් ලබා තිබීම හෝ සහ රජය පිලිගත් ආයතනයක කෘෂිකර්මය පිළිබඳ මාස 6කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම.

හෝ

(ආ)i අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙල) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයන් 06කින් ඕනෑම විෂයන් 03කට සම්මාන සාමාර්ථ සහිතව සමත්ව තිබීම සමග කෘෂිකර්මාන්තය පිළිබඳ පිලිගත් ආයතනයක මාස 06කට නොඅඩු පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම සහ අදාල වැවිලි ක්ෂේත්‍රයේ අක්කර 20කට නොඅඩු වත්තක පාලනය පිළිබඳ වසර 05කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ii අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙල) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයන් 6කින් ඕනෑම විෂයන් 03කට සම්මාන සාමාර්ථ සහිතව සමත්ව තිබීම සමග අදාල වැවිලි ක්ෂේත්‍රයේ අක්කර 20කට නොඅඩු වත්තක පාලනය පිළිබඳ වසර 08කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ඇ)i අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙල) විභාගයෙන් විෂයයන් 03ක් එකවර සමත් වීම සමග පිලිගත් ආයතනයක කෘෂිකර්මාන්තය පිළිබඳ මාස 06කට නොඅඩු පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම සහ අදාල

CamScanner

වැව්ලි ක්ෂේත්‍රයේ අක්කර 20කට නොඅඩු වත්තක පාලනය පිළිබඳ වසර 03කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ii අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයෙන් විෂයයන් 03ක් එක වර සමත් වීම සහ අදාල වැවිලි ක්ෂේත්‍රයේ අක්කර 20 කට නොඅඩු වත්තක පාලනය පිළිබඳ වසර 05කට නොඅඩු පලපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ආ) රජය පිළිගත් ආයතනයක කෘෂිකර්මය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම සමග අදාල වැවිලි ක්ෂේත්‍රයේ අක්කර 20කට නොඅඩු වත්තක පාලනය පිළිබඳ වසර 02කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

මුරකරු

(අ) 8 වන ශ්‍රේණිය සමත් වීම සහ උස අඩි 5,6 කට නොඅඩු වීම.මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත වීම.(වෛද්‍ය සහතිකයක් මගින් සනාථ කල යුතුය.)

මුදල් අයකැමි

(අ) සමුපකාර සේවක 105-10 වැටුප් පරිමාණයේ ක්ෂේත්‍රයට අදල ස්ථිර තනතුරකවසර 05ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ආ) ගණිතය හා සිංහල භාෂාව ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව අ.පො .ස (සා.පෙළ )විභාගයෙන් විෂයන් හයකින් සමත් වීම සහ පිළිගත් ආයතනයක එක් වසරක අයකැමි තනතුරෙහි පළපුරුද්ද ලබා තිබීම .

04. වයස් සීමාව - අවු. 18-45 (විදුලි කාර්මික,මුරකරු,මුදල් අයකැමි)
අවු. 21- 45 වතු භාරකරු සඳහා
(අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සමුපකාර ක්ෂේත්‍රයේ ස්ථිර අයදුම්කරුවනට උපරිම වයස් සීමාව බලනොපානු ලබයි.

05. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

06. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර බඳවා ගැනීමේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත හෝ ලබාදී ඇති පත්වීම අවලංගු කල හැකිය.

07. වෙනත් සමුපකාර සමිතියක සේවයේ නියුතු ස්ථිර සේවකයකු අයදුම්පත් යොමු කරන්නේ නම් තම අයදුම්පත අයදුම්කරු දැනට සේවය කරන සමිතිය හරහාම එවිය යුතු වේ. වෙනත් සමිතියක සේවකයකු සෘජුවම ඉදිරිපත් කර ඇති අයදුම්පත් කිසිදු හේතුවක් නිසාවත් සළකා බලනු නොලැබේ.

08. අයදුම් පත්‍රය යොමු කිරීම

අයදුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ සී/ස දූනගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ අදාළ තනතුර සඳහා බඳවා ගැනීම යන්න සඳහන් කල යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය 2025.01.04 දිනට හෝ පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය (අතින් ගෙනවිත් භාරදීමටද හැකියාව ඇත.) මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

සභාපති,
සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේ,
සමුපකාර සමිතිය

2024..12..13......දින සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය

දූනාගහ. දු.අ 031-2246564 , 031-2243802

CamScanner